ලිංගික අපරාධයන්ට සම්බන්ධ පුවත් වගකීම් සහගතව වාර්තා කරමු!

ලිංගික අතවරයන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ දී, එම වරද සැහැල්ලු කොට දැක්වෙන ආකාරයට සිරස්තල යෙදීම සහ එම සිදුවීම් වාර්තා කිරීම, සමාජය තුළ එවැනි වරද සාමාන්‍යකරණය වීමට හේතුවක් නොවන්නේදැයි Ethics Eye අපි මින් පෙර ද අසා ඇත්තෙමු.

මෙම තත්ත්වයට නිදසුනක් ලෙසට, ලිංගික අපරාධ සිදුවීම් දෙකක්, පුවත්පත් කීපයක (අගෝස්තු 07, 2023) වාර්තා වී ඇති ආකාරය සලකා බැලිය හැක.

දිනමිණ - ලිංගික අපරාධයක් "කතක් රැවටීමක්" ලෙසින් සිරස්තලයේ දක්වා ඇත.

දිනමිණ - බාල වයස් ලිංගික අතවරයක් "හෝටලයකට එක්ක යෑමක්" ලෙසින් සිරස්තලයේ දක්වා ඇත.

මව්බිම - බාල වයස් ලිංගික අතවරයක් "හෝටලයට ගෙන ඒමක්" ලෙසින් සිරස්තලයේ දක්වා ඇත.

ඔබ සිතන ලෙසට,

1) මෙම සිරස්තල හරහා, ලිංගික අපරාධ සැහැල්ලු කොට දක්වා නොමැති ද?

2) එසේ ලිංගික අපරාධ සැහැල්ලු කොට වාර්තා වීම ඔස්සේ, මෙම අපරාධ සම්බන්ධයෙන් සාමාන්‍යකරණය වීමක් සමාජය තුළ ඇති වීමේ අවදානමක් නොමැති ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!